## පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් - 2017

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්හි(“සමාගම”) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පරන්තන් කෙමිකල් කම්පැනි ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ බොල් හා අඩමාන ණය වෙන් කිරීම් රු.9,632,553 ක් වූ අතර සමාගමේ ප්‍රධාන ගැණුම්කරු වන ජල සම්පාදන මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අය විය යුතු රු.1,387,445 ක් අයකරගැනීමට කටයුතු නොකර බොල් හා අඩමාන ණය ලෙස වෙන් කිරීම් කර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.2.2 වගන්තිය හා 2013 මාර්තු 04 දින පැවැත්වූ කෝප් කමිටු නිර්දේශයන්හි 08 වන ඡේදයට අනුව මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ එකඟතාවය මත අතිරික්ත මුදල් ආයෝජනය කළයුතු වුවත් අදාල අනුමැතීන් නොමැතිව සමාගමේ නිසි බලධාරිගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී රු.135,000,000ක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 99,899,337ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.61,029,489 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු.38,869,848 කින් වර්ධනය වී තිබුණි. දළ ලාභය රු.33,958,461 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ දැක්ම රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රමුඛයාවීම වුවත් 1985 වර්ෂයේ සිට කිසිදු රසායන ද්‍රව්‍යයක් නිෂ්පාදනය නොකර රසායන ද්‍රව්‍ය ආනයනය කර විකිණීම සමාගමේ ප්‍රධාන කාර්යය ලෙස ඉටු කර තිබුණි. ඒ අනුව සමාගමේ ප්‍රධාන ආදායම් මාර්ගය වන දියර ක්ලෝරීන් අපනයනය කර විකිණීමෙන් සමාගමේ මුළු ආදායමෙන් සියයට 81ක් සපුරාගෙන තිබුණි. ආනයනික ක්ලෝරීන් වලින් සියයට 76.5 ක් ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලයේ ජලය පිරිපහදු කිරීමේ කර්මාන්තයට යොදා ගනු ලබන අතර අනෙකුත් අවශ්‍යතා සඳහා සියයට 23.5ක පමණ සුළු ප්‍රමාණයක් යොදා ගනු ලබයි.

(ආ) 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද එහි වාර්ෂික ප්‍රගතිය පිළියෙල කර නොතිබුණු අතර 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් වී නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ සමාගමේ ක්‍රියාකාරකම් එක් එක් අංශ යටතේ හඳුනා ගෙන තිබුණු අතර, ඒවා ක්‍රියාත්මකවීම පිළිබඳ පරීක්ෂාවේදී ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලයට ක්ලෝරීන් ලබා දෙන මිල ස්ථාවරව පවත්වා ගැනීම හා ණය සීමාව වැඩි කිරීම, නව ජල ව්‍යාපෘති සඳහා දියර ක්ලෝරීන් හඳුන්වා දීම, වෙනත් රසායන ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්ත සඳහා ක්ලෝරීන් නිකුත් කිරීම හා ගැණුම්කරුවන් සඳහා ආරක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද අදාල වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2015 සැප්තැම්බර් 25 දින සිට සමාගමේ පරිපාලනය නිසි බලධාරියෙකු යටතේ සිදුවන අතර විගණිත දින වූ 2017 දෙසැම්බර් 31 දක්වාම අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබීම හේතුවෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 (1) වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1986 වර්ෂයේ සිට පරන්තන් නිෂ්පාදනාගාරයේ ක්ලෝරීන් නිෂ්පාදනය නවතා දැමීම හේතුවෙන් මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් මුළුමනින්ම ආනයනය මඟින් සපයා ගැනීමට කටයුතු කර තිබූ අතර එම නිෂ්පාදනාගාරයේ කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

(ආ) කළුතර නාගොඩ ප්‍රදේශයේ, කෝස්ටික් සෝඩා දියර නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යන්ත්‍ර මිලට ගැනීම හා එකී යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම වෙනුවෙන් 2016 හා 2017 වර්ෂවලදී රු.3,065,834 ක වියදමක් දරා තිබුණි. එම ව්‍යාපෘතියෙන් 2017 වර්ෂය තුල කෝස්ටික් සෝඩා මෙට්‍රික් ටොන් 2.320 ක් නිෂ්පාදනය කර තිබුණු අතර යන්ත්‍ර අක්‍රීය වීම හේතුවෙන් කෝස්ටික් සෝඩා නිෂ්පාදනය 2017 ජූනි මාසයේ සිට නවතා දමා තිබුණි. කෙසේ වුවද 2018 ජූලි 31 දින වන විටත් නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය වත්කම්**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළුතර ප්‍රදේශයේ ක්ලෝරීන් පිරිපහදු කිරීමේ නව ඒකකය ස්ථාපනය කිරීම වෙනුවෙන් රු.25,000,000 ක් වැය කර ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිල්ල හා කුඩා ගොඩනැගිලි දෙකක් 2009 වර්ෂයේ සිට අදාල කාර්යයන් සඳහා යොදානොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) ජංගම බැංකු ගිණුම් දෙකක එකතුව රු.101,693 ක් වූ ශේෂයන් වර්ෂ 02 සිට වර්ෂ 03ක කාල පරාසයක සිට උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 2.5.1 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු තාවකාලිකව මුදාහැරීම වර්ෂ 02 කට සීමා විය යුතු වුවද, සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාව 2002 වර්ෂයේ සිට 2018 ජූලි 31 දින දක්වාම වෙනත් රජයේ ආයතනවලට මුදා හැර තිබුණි.

(ආ) විනය හේතූන් මත කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය වෙත 2016 ජූනි මාසයේ සිට ස්ථාන මාරු කර යවා තිබූ නිලධාරිනිය වෙත 2016 හා 2017 වර්ෂවලට අදාලව ගෙවන ලද රු. 926,822 ක් වූ වැටුප් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

--------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම**

----------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත සමාගම විසින් සිය විෂය පථය අනුව ලඟා කර ගත යුතු අරමුණු වශයෙන් හොඳ සෞඛ්‍ය පුරුදු හා යහපත් පැවැත්ම සහ පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව ලෙස හඳුනා ගෙන තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ කාර්ය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවය ලෙස රාජ්‍ය හා පුද්ගලික ආයතන, සිවිල් සංවිධාන හඳුනා ගත හැකි වුවද සමාගම විසින් ඔවුන් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී ඇතැම් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර ඉලක්ක කරා ලඟාවීම සඳහා සමාගම විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුලත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

---

#### 6.1.1 ප්‍රසම්පාදනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව සකස්කල ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්ම මාස 06කට වැඩි නොවන කාලයක් තුලදී යාවත්කාලින කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය අනුව නියමිත ආකෘතිය ප්‍රකාරව භාණ්ඩ, සේවා , වැඩ වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි ආරම්භයේ සිට අවසානය දක්වා පියවරයන් ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර වරින්වර ඇස්තමේන්තු කැඳවමින් හා ගිවිසුම්ගත වීමකින් තොරව ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත කොටස් වශයෙන් ලබාදී තිබුණි. ඒ අනුව කාමර වෙන්කිරීම හා ඇළුමිනියම් ජනෙල් දොරවල් අළුතින් ඉදිකිරීමට අදාල රු.2,276,655ක ඇස්තමේන්තුගත වටිනාකම වූ කොන්ත්‍රාත්තුවට අදාල මුළු මුදලම එකවර ගෙවා තිබුණද විගණිත දිනය වූ 2018 ජූලි 31 වන දින වන විටත් කොන්ත්‍රාත්තුවෙහි වැඩ නිම කර නොතිබුණි.

### 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 දෙසැම්බර් 31 දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ නිසි බලධාරියාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ණයගැති පාලනය | | දීර්ඝ කාලීනව අයනොවී පවතින ණය ශේෂයන් අයකර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ආ) | පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම | | ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය කාලීනව උප ඉන්වෙන්ට්‍රි ලේඛන සමඟ සැසඳීම් නොකිරීම, තොග ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබීම හා ලිපිගොනු ක්‍රමානුකූලව පවත්වා නොගැනීම. |
| (ඇ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් යෙදීමේ කටයුතු නිසි අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන නිලධාරීන් විසින්ම සිදුකිරීම. |
| | | (ii) | වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබීම. |
| (ඈ) | තොග පාලනය | (i) | කල් ඉකුත් වූ, චලනය නොවන හා සෙමින් චලනය වන තොග හඳුනාගෙන ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමට ක්‍රියා නොකිරීම |
| | | (ii) | භෞතික තොග ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග ශේෂය අතර වෙනස්කම් පැවතීම. |
| | | (iii) | සමාගම සතු සියළුම තොග භෞතික තොග සමීක්ෂණයට ලක් කර නොතිබීම. |